**කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය- 2021**

---

කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2020 ජුලි 23 දින එලඹි අංක 6727 - එල්කේ සහ 6728 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ V ව්‍යාස්ථාවේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වසංගත කාලසීමාව තුළ පොරොත්තු ලේඛනයේ අයදුම්කරුවන් ඇතුළත් කිරීම සහ/හෝ පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් යටතේ වැඩි මුදලක් ලබා දීම මගින් ආබාධ සහිත වැඩිහිටි පුද්ගලයින් සහ නිදන්ගත රෝගාබාධ සහිත රෝගීන් සඳහා පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් හරහා මුදල් ලබාදීම් වැඩිකිරීම වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,248.45 කට සමාන එජඩො මිලියන 87.24ක මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2020 ජුලි 23 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගනනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රට අගුලු දැමීම සහ ඇඳිරි නීතිය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූවන් සඳහා රු. 5,000 දීමනා සහ රු. 10,000 ක අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීමට රජය ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව, ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ඉහත දීමනා සඳහා රු. මිලියන 9,887ක මුදලක් ලබා දී ඇති අතර රජය රු. මිලියන 12,249ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මුදල් ලබාදීම් සම්බන්ධ වෙනම තොරතුරු විගණනය සඳහා ලබාදී නොතිබුණි. | අදාළ ණය ගිවිසුම 2021.01.20 දින සංශෝධනය කර ඇත. මහා භාණ්ඩාගාරයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබාදෙන ලද ප්‍රතිපාදන රජයේ මුදල් බැවින් එය ලෝක බැංකු ආධාර යටතේ ලබාදුන් මුදල් ලෙස සඳහන් කර නොමැත. මහා භාණ්ඩාගාරය විසින් දරන ලද සම්පූර්ණ පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමට ලෝක බැංකුව එකඟ වී නොමැත. එමනිසා භාණ්ඩාගාරය සතුව තිබුණු මුදල් සියල්ල ප්‍රතිපූර්ණය කර නොමැත. සමස්ත ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කරන ලද ලෝක බැංකු ආධාර මුදලට වඩා වැඩි මුදලක් රජය වැය කර ඇත. | රජයේ සහ ලෝක බැංකු අරමුදල් භාවිතය වෙනම හඳුනා ගැනීම සඳහා වාර්තාව පවත්වාගෙන යා යුතුය. . |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනය විසින් අයකරගන්නා ලද ඉදිරිපස ගාස්තුව රු. මිලියන 19.4ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොවිඩ්-19 වසංගතයේ දෙවන සහ තෙවන රැල්ල සඳහා භාණ්ඩාගාරය විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණයට අදාළව පමණක් මෙම ගිණුම් වාර්තාව සකස් කර ඇති අතර මෙම වැඩසටහනට අදාළ මව් ව්‍යාපෘතිය යටතේ මෙම ණය මුදලට අදාළ ඉදිරිපස ගාස්තුව ගිණුම්ගත කිරීම සුදුසු වේ. මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකිය. | සියලුම ව්‍යාපෘති වියදම් වියදම් ප්‍රකාශයේ සඳහන් කළ යුතුය |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 වැඩ බිමේ කරන ලද නියදි විගණන පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කරන ලැබේ**

**(අ) හාරිස්පත්තුව සහ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඔවුන් නිරෝධායනයට ලක් වූ පවුල්වලට අයත් දැයි සෞඛ්‍ය සේවා නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් සහතිකයක් නොමැතිව හාරිස්පත්තුව සහ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආහාර මලු බෙදා හැරීමට රු. මිලියන 21.5ක් සහ රු. රු. මිලියන 30.6ක් වැය කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | සියලුම බෙදාහැරීම් නීති රීති වලට අනුකූලව සිදු කළ යුතුය. |
| (ආ) | කොවිඩ් 19 ව්‍යාපෘතිය පාලනය කිරීම සඳහා ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීමේ ජනාධිපති කාර්ය සාධක බලකායේ ලේකම්වරයාගේ 2021 අගෝස්තු 22 දිනැති අංක පීටීඑෆ්/03-2021(ii) චක්‍රලේඛය අනුව, රට තාවකාලිකව වසා දැමීම නිසා ජීවනෝපාය අහිමි වූවන්ට රු. 2000ක දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව, පුද්ගලයන් 7,441 දෙනෙකු සඳහා රු. මිලියන 14.9ක් බෙදා දී තිබුණි. කෙසේවෙතත්, ප්‍රතිලාභීන් විසින් අත්සන් කරන ලද ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකළ බැවින් එය සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදහස් දක්වා නොමැත. | ප්‍රතිලාභීන්ගේ තොරතුරු සහ අත්සන සහිත වාර්තාව විගණනය සඳහා ලබාදිය යුතුය. |
| (ඇ) | මාර්තු 31 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ චක්‍රලේඛ අංක පීටීඑෆ්/01/චක්‍රලේඛය/01 අනුව, කොවිඩ්-19 වසංගත කාලසීමාව තුළ පොරොත්තු ලේඛනයේ සිටින ප්‍රතිලාභීන් 142 දෙනෙකුට මුදල් ලැබීම පිළිබද අත්සන් ලබා ගැනීමකින් තොරව රු. 5,000ක දීමනාව ලෙස රු. 710,000ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රතිලාභ ලැබීම අත්සන් මගින් තහවුරු කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

(ආ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | ජන හා නිවාස සංගණනයට අනුව, රජයේ, අර්ධ රාජ්‍ය සහ විශ්‍රාමික පවුල් හැර කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු පවුල් සංඛ්‍යාව 322,143 (ත්‍රිවිධ හමුදාව හැර). කෙසේවෙතත්, දිස්ත්‍රක්කයේ මුළු පවුල් සංඛ්‍යාව ඉක්මවමින් පවුල් 563,652ක් සඳහා රු. 5,000 දීමනාව ගෙවා ඇත. | අදහස් දක්වා නොමැත. | ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව රජයේ සංඛ්‍යාලේඛන සමඟ සමාන විය යුතුය. |
| (ආ) | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයාගේ 2020 අප්‍රේල් 30 දිනැති අංක ඩීඑස්කේයු/ඒඩීඑම්/එස්යූඩී/එස්එස්/එන්එස්ර්ඩීඑ ල්/02 ලිපියට අනුව, 2020 මැයි මාසයට අදාළ ගෙවීමේදී, වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් සඳහා ජීවනෝපාය අහිමිවීම මත කිසියම් ප්‍රතිලාභයක් ගෙවා ඇත්නම්, රු. 5000ක දීමනාව ලබාගැනීමට සුදුසුකම් නොමැති වුවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04ක තෝරාගත් වසම්වල වැඩිහිටියන් 30 දෙනෙකුට නිසි රෙගුලාසිවලට පටහැනිව ගෙවා ඇත. | අදහස් දක්වා නොමැත. | නිවැරදි දත්ත පදනම් කරගෙන ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඇ) | නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ සමෘද්ධි දීමනාව සහ ජීවනෝපාය අහිමි දීමනාව යන දෙකම එකම නිවාස අංකය යටතේ ලබා තිබුණු අතර ඒවා අනු පවුල් සඳහා වෙන් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ආධාර ලබා ගැනීමේ සහ ගෙවීම් කිරීමේ ක්‍රමය තීරණය කළ යුතුය. |
| (ඈ) | නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක ආබාධිත පුද්ගලයන් සඳහා දීමනා ගෙවීමේදී සමාජ සේවා නිලධාරී/සමාජ සංවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරීගේ නිර්දේශය සහ අදාළ අයදුම්පත්‍රයේ ආබාධිතභාවය සම්පූර්ණයෙන් නිර්දේශ කර නොතිබූ අතර ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරන එක් කොටස සම්පූර්ණ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ නිලධාරීන්ගේ නිර්දේශයට අනුව දීමනා බෙදා හැරිය යුතුය. |
| (ඉ) | 2020 අප්‍රේල් 15 දිනැති අංක පීටීර්/01/චක්‍රලේඛය/01 මගින් හඳුන්වා දී ඇති ආකෘතිය ඉදිරිපත් කිරීමකින් තොරව කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය 11ක ප්‍රතිලාභීන් 215 දෙනෙකු සඳහා දීමනා ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |
| (ඊ) | ඉලුප්පුගෙදර වසමේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් ඇතුළත් නොවූ පුද්ගලයන් සඳහා වැඩිහිටි, ආබාධිත, ජීවනෝපාය දීමනා කමිටු තීරණ මගින් අවස්ථා 8කදී දීමනාව ලබාදී තිබුණි. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |

(ඇ) පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රාදේශීය ලේකම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2020 අප්‍රේල් 03 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ පීටීඑෆ්/02/2020(i) දරන චක්‍රලේඛයේ 05 ඡේදයට අනුව, කොරෝනා නිසා ඇති වූ ව්‍යසනකාරී තත්ත්වය තුළ රජය විසින් ක්‍රියාත්මක කරන ලද සමාජ ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහනේ ග්‍රාමීය කමිටු විසින් නිර්දේශ කරන ලද ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කළ යුතුය. ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ග්‍රාමීය සේවා වසම් 03කට අදාළව රු. මිලියන 2.2ක් සහ ග්‍රාමීය කමිටුවේ නිර්දේශයකින් තොරව ග්‍රාමීය සේවා වසම් 02කට අදාළව රු. 460,000ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |
| (ආ) | 2020 අප්‍රේල් 20 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ පීටීඑෆ්/03/2020(iv) දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, අලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවි විශ්‍රාම වැටුප් ලැබූ ප්‍රතිලාභීන් 05 දෙනෙකු සඳහා රු. 25,000 බැගින් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |
| (ඇ) | දියබෑදුම ග්‍රාම නිලධාරී වසමේ ගෙවීම් වවුචර පරීක්ෂා කිරීමේදී ග්‍රාමීය කමිටු මගින් නිර්දේශිත නම් ඉවත් කර ඒ වෙනුවට රු. 15,000ක් ගෙවා ඇති අවස්ථා 03ක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |
| (ඈ) | අග්‍රාමාත්‍ය ලේකම්ගේ පීටීඑෆ්/03/2020(iv) සහ 2020 අප්‍රේල් 20 දිනැති අග්‍රාමාත්‍ය ලේකම්ගේ චක්‍රලේඛයට අනුව, විදේශගත සාමාජිකයින්ට මුදල් එවා නැති බවත් පෙර ඉතිරිකිරීම් නොමැති බවත් තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිලාභ ගෙවිය යුතු විය. කෙසේවෙතත්, දියබෙදුම වසමේ ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා රු.50,000ක් ගෙවා තිබුණි. ශේෂය තහවුරු කිරීමකින් තොරව ගෙවීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |
| (ඉ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 12 දෙනෙකු සඳහා රු. 60,000ක මුදලක් සහ හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 16 දෙනෙකු සඳහා රු. 80,000ක මුදලක් හැඳුනුම්පත් අංක ලබා නොගෙන ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | දීමනා රජයේ නීති රීතිවලට අනුකූලව බෙදා හැරිය යුතුය. |